**ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 22 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| 2019 වර්ෂයේ ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.2(අ) 1.6.1(iii) | වාර්ෂික ක්ෂය ප්‍රතිශතය නිවැරදිව යොදා නොගැනීම නිසා වාහන ක්ෂය වියදම රු. 1,404,310 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්ෂය කිරීමේ දෝෂයන් හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලිවල ආරම්භක හා අවසාන ශේෂ පිළිවෙලින් රු.83,766,584 කින් හා රු. 30,104,542 කින් ද ක්ෂය හා සමුච්චිත ක්ෂය පිළිවෙලින්රු.57,139,805 කින් හා රු.62,040,873 කින් ද වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. |
| (ආ) ක්ෂය කිරීමේ දෝෂයක් හේතුවෙන් වාහන ආරම්භක ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ක්ෂය පිළිවෙළින් රු. 1,182,260 ක් හා රු.118,226 ක් අඩුවෙන් ද සමුච්චිත ක්ෂය රු. 245,519 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.2 වාණිජ අත්තිකාරම් ගිණුම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 වර්ෂයේ සිට මුද්‍රණ ගාස්තු වෙනුවෙන් පෞද්ගලික සමාගමකින් ලැබිය යුතු රු. 7,431,012 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සමස්ථ ණය හිමි ශේෂය රු.100,078,738 කින් වැඩියෙන් ද මුද්‍රණාල 02 ක ණය හිමි ශේෂ රු.12,384,798 කින් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. 2013 වර්ෂයේ සිට පැවත එන රු. 1,521,750 ක ණය හිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකඟ වන බව. | නිවැරදි කිරීමට කටයුතු කල යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුව අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයට අදාල රු.62,258,364 ක අයභාරයක් සමාලෝචිත වර්ෂයේ අයභාරයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එකඟ වන බව | නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම. |

**2.2 වියදම් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 05 කට අදාලව සියයට 18 සිට සියයට 95 දක්වා පරාසයක රු.15,675,287 ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | එකඟ වන බව | නිවැරදිව ඇස්තමේන්තු සකස් කල යුතු වීම. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ, බැරකම් ලේඛනයේ හා 2021 වර්ෂයේ වැය ලෙජරයේ පිළිවෙලින් රු.143,978 ක් රු.68,070 ක් හා රු.167,233 ක් ලෙස දක්වා තිබුණි. | 2019 වැය ලෙජරයේ සඳහන් වී නැති බව. | නිවැරදිව ලේඛනවල සඳහන් කල යුතු වීම. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 104 සිට 109 | භාවිතයට නුසුදුසු, ප්‍රයෝජනයට ගත නොහැකි එකතුව රු.8,484,244 ක් වටිනා පොත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

(ආ) **වත්කම් කළමනාකරණ චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමණාකරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් සම්බන්ධ විස්තර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ලබා දිය යුතු වුව ද එසේ කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 4/2018 දරන මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමණාකරන චක්‍රලේඛය | 1/2017 චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා 2019 ජනවාරි 01 දිනට ක්‍රියාත්මක වන පරිදි වත්කම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හඳුනා නොගත් රු.17,321,538 ක ලැබීම් ශේෂයක් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතු වේ. |

**2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සසැඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 5 ක් ඉක්ම වූ රු. 458,592 ක ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | පැරණි ණය ශේෂයයන් අය කර ගැනීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙළ කර නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. |

### 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමානාය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් ප්‍රවර්ධනය සඳහා 2019 හා 2020 වර්ෂය සඳහා රුපියල් මිලියන 35 ක් ලබා දී තිබුණු අතර රු.20,474,489 ක් ව්‍යාපෘති අරමුණු වලට පටහැනිව වැය කර තිබුණි. එ් අනුව දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පුද්ගල ධාරිතාවය වැඩි දියුණු කිරීම, සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ළමා කතාන්තර පොතක් නිර්මාණය කිරීම, 5 ශ්‍රේණියේ පෙළ පොත් සමාලෝචන වැඩ මුළු පැවැත්වීම, උපකරණ මිලදී ගැනීම වැනි කාර්යයන් සඳහා වැයකර තිබුණි. | මෙම අරමුණු සඳහා අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන ඇති බව | ව්‍යාපෘතියේ අරමුණු ඉටු කරගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) ළමා මනසෙහි ආකල්ප වර්ධනය කිරීම අරමුණු කරගෙන ලේඛකයෙකු ළමා කතාන්තර පොතක් ලියවා ගැනීම සඳහා ව්‍යාපෘතියෙන් රු.5,758,993 ක් වැය කර සිංහල පිටපත් 155,475 ක් හා දෙමළ පිටපත් 73,475 ක් මුද්‍රණය කර තිබුණි. මෙම පොත් වලින් රු.2,072,500 ක් වටිනා පොත් 82,900 ක් 2021 මැයි 20 දින වන විටත් බෙදා නොහැර ගබඩාවේ ඉතිරි වී තිබුණි. | එකඟ වන බව. | විධිමත් ක්‍රමයකට පොත් බෙදා හැරීමට හා දර්ශකය අනුව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව රු.මිලියන 39 ක වියදමෙන් දෙපාර්තමේන්තුවේ පෙළ පොත් බෙදා හැරීමේ හා විකිණීමේ ක්‍රමවේදය පරිගණකගත කිරීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදීද ඒ අනුව ක්‍රියාකර නොතිබුණි. | කටයුතු කරමින් පවතින බව. | ව්‍යාපෘති අරමුදල් වලට අදාළ දර්ශක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මකට අනුව කටයුතු කිරීම. |

**3.3 කළමනාකරණ දුර්වලතා**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා පෙළ පොත් බෙදාහැරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී තිබුණ ද තොග ශේෂය පොත් 20,000 ඉක්ම වූ පෙළ පොත් වර්ග 128 කට අයත් රු.593,839,740 ක් වටිනා පෙළ පොත් 4,761,461 ක තොගයක් 2021 ජනවාරි 31 දින වන විට ගබඩාවේ ඉතිරි වී තිබුණි. | එකඟ වන බව. | වර්ෂයට අදාල පෙළපොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීම. |
| (ආ) වර්ෂයට අදාල පෙළ පොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව පෙළ පොත් මුද්‍රණය කිරීම නිසා මුද්‍රණය කරන ලද පොත් වසර 02 ක් සඳහා නිකුත් කිරීමෙන් පසුව ද තොග ශේෂය පොත් 25,000 ඉක්ම වන පොත් වර්ග 07 කට අයත් රු.48,239,420 ක් වටිනා පොත් 412,632 ක තොගයක් 2021 ජනවාරි 31 දිනට ගබඩාවේ ඉතිරි වී තිබුණි. | එකඟ වන බව. | -එම- |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ පෙළ පොත් සඳහා ගෙවීම් කිරීමේදී පිටු අඩු හා වැඩි වීම සඳහා පිළිවෙලින් රු.17,039,257ක් හා රු.16,636,231 ක් අයකර තිබුණු අතර ප්‍රමාද වීම්, GSM අගය වෙනස් වීම නිසා රු.62,696,397 ක දඩ ගෙවා තිබුණි. මෙලෙස පිටු අඩු සහ වැඩි වීම් වලදී පෙළ පොත්වල අන්තර්ගතය වෙනස් වීම මත සිසුන් අපහසුතාවයට පත්විය හැකි බැවින් ගෙවීම් කිරීමේදී හා සැලසුම් කිරීමේදී ඒ පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි. | එකඟ වන බව. | ගෙවීම් කිරීමේදී හා සැලසුම් කිරීමේදී සැලකිලිමත්ව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පෙර වර්ෂවලදී මුද්‍රණය කරන ලද රු.333,945,008 ක වටිනා අතිරේක පොත් 1,584,066 ක් ද රු.96,915,726 ක් වටිනා ගුරු අත්පොත් 605,369 ක් ද වටිනාකම හඳුනාගත නොහැකි අතිරේක පොත් 23,742 ක් හා ගුරු අත් පොත් 158,775 ක් 2020 දෙසැම්බර් 31 දිනට ගබඩාවල බෙදා නොහැර තිබුණි.අ | එකඟ වන බව. | වාර්ෂික පොත් අවශ්‍යතාවය හා ඉතිරි තොගය සැලකිල්ලට ගෙන පොත් මුද්‍රණය කිරීමට කටයුතු කිරීම. |
| (ඉ) | පෙර වර්ෂ වලට හා සමාලෝචිත වර්ෂයට අදාල රු.22,551,350 ක් වටිනා පෙළ පොත් , ගුරු මාර්ගෝපදේශ සහ අතිරේක පොත් 2021 පෙබරවාරි 28 දින වන විටත් මුද්‍රණය කර භාර දී නොතිබුණි. | එකඟ වන බව. | නියමිත දිනයේදී මුද්‍රිත පොත් ලබා ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු 48 ක් පවතින අතර එම පෙළ පොත් සකස් කිරීමට අවශ්‍ය වන චිත්‍ර ශිල්පි තනතුරු 01 ක් පරිගණක පිටු සැකසුම්කරණ තනතුරු 04ක් මෙම පුරප්පාඩු වලට ඇතුළත් වී තිබුණි. | එකඟ වී ඇත. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කිරීම. |